# අධ්‍යාපනය

ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගමය

අධ්‍යාපන පීඨය - කොළඹ විශ්ව විද්‍යාලය

අංක 25 කලාපය - 1995 සැප්තැම්බර්

සංස්කාරක: මහාචාර්ය එස්. රුපසිංහ

## ශ්‍රී ලංකාවේ

## නිදහස් අධ්‍යාපනය

# 50

## වසර පනහ සමරුව

## 1945 - 1995

# ශ්‍රී ලංකාවේ පාසැල්වල පළමු වසර සඳහා නියමිත වයස් සීමාව තුලදී හා එම සීමාවට පසුව ඇතුලත් වන සිසුන් පිළිබඳ සංඛ්‍යාත්මක අධ්‍යයනයක්

ප්‍රජා විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**ආචාර්ය ඩබ්. ඉන්දුලාල් ද සිල්වා**

## හැඳින්වීම

විධිමත් අධ්‍යාපන පද්ධති තුළින් අපේක්‍ෂා කරනුයේ සමාජයේ අවශ්‍යතාවයන්ට සරිලන ලෙසට පුද්ගලයන් හැඩගැස්වීමයි. එමනිසා විධිමත් අධ්‍යාපනය සකස් විය යුත්තේද දේශීය සංස්කෘතිය, සම්ප්‍රදායන් හා අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙසිනි. එසේ නම් විධිමත් අධ්‍යාපනයේ ආරම්භක අවධිය වන්නාවූ ප්‍රාථමික අධ්‍යාපනය අත්‍යාවශ්‍ය ලෙසම යම්කිසි ක්‍රමානුකූල හා සංවිධානාත්මක බවකින් යුක්ත විය යුතුය. ළමුන් පාසල් වලට ඇතුල් කිරීමේදී ප්‍රාථමික අධ්‍යාපනය තුළින් විවර වන චින්තනය පිළිබඳ දැඩි අවධානයක් යොමුකළ යුතු බව පෙනේ. විධිමත් අධ්‍යාපනයේ ආරම්භය තුළින් ළමුන් යොමුවිය යුතු අංශ පිළිබඳව නිරවුල් මාර්ගය විවර වන බව පිළිගත යුත්තකි. එමනිසා ප්‍රාථමික අධ්‍යාපනය වඩා ඵලදායී වූත්, සැලසුම්ගතවූත් එකක් විය යුතුය.

ලෝකයේ සංවර්ධිත රටවල් මෙන්ම ඌණ සංවර්ධිත රටවල්ද විධිමත් අධ්‍යාපනය තුළින් ළමුන්ගේ කායික මෙන්ම මානසික සංවර්ධනය ඇති කිරීමේත්, ඒ මගින් ඔවුන් රටට ඵලදායී පුරවැසියන් බවට පත් කිරීමේත් දැඩි උත්සාහයක යෙදී සිටිති. එහිදී බොහෝ රටවල ළමුන් පාසැල් වලට ඇතුලු කිරීමේදී යම්කිසි නියමිත වයසක් පදනම් කරගෙන සිදු කරනු ලබයි. එමගින් අපේක්ෂා කරන්නේ නිසි වයසේදී ළමුන් විධිමත් අධ්‍යාපනයට යොමු කිරීමකි. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ පාසැල් වල පළමු වසරට ළමුන් ඇතුලු කරන නියමිත වයස වන්නේ අදාල වර්ෂයේ ජනවාරි 31 දිනට අවුරුදු 5-6 අතර වයසේ සිටින ළමුන්ය. වෙනත් ආකාරයකින් අර්ථ දක්වන්නේ නම් පළමු වසරට ප්‍රවේශ වීමට නියමිත වයස වනුයේ පස්වන උපන්දිනය සමරා ඇති එහෙත් සයවන උපන්දිනය සමරා නොමැති ළමුන්ය.

ලෝකයේ සංවර්ධනය වන රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම (අවුරුදු 10 හෝ ඊට වැඩි පුද්ගලයින්ගේ) 90% ක් පමණ වන ඉහළ අගයක් වාර්තා කරයි. එමගින් තහවුරු වන්නේ ආර්ථික වශයෙන් ශ්‍රී ලංකාව තුන්වන ලොවේ රටවල් කණ්ඩායමට අයත් වුවද අධ්‍යාපන අංශය පොදුවේ සලකන විට සැලකිය යුතු තරම් වන ප්‍රගතියක් කරා ළඟාවී ඇති බවයි. මෙවැනි යහපත් තත්ත්වයක් පෙන්නුම් කළද ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ නොයෙක් දුර්වලතා විද්‍යාමාන වේ. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය තුළ දැකිය හැකි ප්‍රධාන දුර්වලතාවය වන්නේ පාසැල් වලට නියමිත වයසට පසුව ළමුන් ඇතුලු වීමයි.

# අධ්‍යාපනය

අංක 25 - ඇතුළත | පිටු


1 සාරධර්ම අධ්‍යාපනය — 1 - 9
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සී. කාරියවසම්

2 9 වසර සිසුන්ගේ වෘත්තීය අපේක්ෂා — 10 - 21
ඒ. ඇන්. අමරසිංහ

3 පනස්වසරක නිදහස් අධ්‍යාපනය — 22 - 44
මහාචාර්ය එස්. රූපසිංහ

4 සදාචාරවර්ධනය ගැන පියාජේ කෝල්බර්ග් හා ගිලිගන් ගේ අදහස් — 45 - 55
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රෝලන්ඩ් අබේපාල

5 පාසල්වල පළමු වසරට ළමුන් ඇතුළත් කිරීම පිළිබඳ අධ්‍යයනයක් — 56 - 81
ආචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා

6 Development & Implementation of a new Approach to School Administration — 82 - 104
Dr. D. Thenuwara Gamage



සාර ප්‍රකාශන හා මුද්‍රණ
94/1. අතුරුගිරිය පාර. කොට්ටාව